## 18.වැරදි (Faults)

බැඩ්මින්ටන් තරඟයකදී පොදු වැරදි (common faults) කිහිපයක් ඔබගේ දැන ගැනීම සඳහා පහතින් දක්වමු.

18.1. 13 කොටසේ සඳහන් පිරිනැමීම් (service faults) වැරදි සිදුකල විට

18.2. 14.1 ඡේදයේ විස්තර කර ඇති පිරිනැමීම් පිටි වැරදි (service court errors) සිදුකල විට

18.3. ක්‍රීඩා අතුරු වාරයකදී (rally) පිහාටු පන්දුව ( Shuttlecock) ;

18.3.1. බැඩ්මින්ටන් පිටියේ අදාල සීමා ඉරි (boundary lines) වලින් **පිටත** (එහි මුඩිය knob of the shuttle cock) පතිතවීම.

18.3.2. දැල ( net ) **හරහා** හෝ **යටින්** ගමන් කිරීම. [ප්‍රතිවාදියාට බාධා නොවන ලෙස පාදය දැල ( net ) යටින් ගමන් කල හැක.] ( 18.3.4 නීතියට පටහැනි නොවන ලෙස)

18.3.3. ක්‍රීඩකයන්ගේ හෝ ඔවුන්ගේ ඇඳුම්වල හෝ බැඩ්මින්ටන් පිටියට පිටින් අසල ඇති කුමන හෝ වස්තුවක (object) ෂටලය ස්පර්ශවීමකදී

18.3.4. ෂටලයට (shuttlecock) පහර වදින අවස්ථාවේදී (initial point of contact) බැඩ්මින්ටන් පිත්ත තමන්ගේ පැත්තේ **නොමැති** අවස්ථාවකදී (**not** strikers side of the net) : පිත්ත, ඇඳුම හෝ ශරීරයේ කුමන කොටසක් හෝ දැලෙහි (net) ස්පර්ශ වූවිට

18.3.5. ක්‍රීඩා කිරීමේදී ෂටලය (shuttlecock) බැඩ්මින්ටන් පිත්තේ රැඳීම නිසා

18.3.6. එකම ක්‍රීඩකයා විසින් එකවර පහරවල් 2 ක් (02 strokes) ගැසීම.

## 19.ක්‍රීඩා අතුරුවාරය (rally) නැවත ඇරඹීමට (Lets) ඉඩදීම

19.1. බලාපොරොත්තු නොවූ හදිසි අවස්ථාවකදී (උදා හදිසි අනතුරක්)

19.2. පිහාටු පන්දුව (shuttlecock) දැල උඩ පාවෙමින් සිට දැල (net) හරහා ගොස් දැලේ අනික් පැත්තේ රැඳීම (caught in the other side of the net) {**පිරිනැමීමකදී (service) හැර** }

19.3. පිරිනැමීම ලබන්නා (receiver) **සූදානම් වීමට පෙර** පිරිනැමීම සිදුකරන්නා (server) පිරිනැමීම ඉදිරිපත් කිරීම.

19.4. ක්‍රීඩා කිරීමේදී ෂටලයේ (shuttlecock) මුඩිය (knob/base) සම්පූර්ණයෙන්ම ගැලවී වෙන්වී යාම.

19.5. රේඛා විනිසුරු (line judge) සහ ප්‍රධාන විනිසුරු (umpire) දෙපලටම ෂටලය (shuttlecock) බැඩ්මින්ටන් පිටියේ ස්ථානගතවූ ආකාරය ගැන තීරණයක් දීමට නොහැකි අවස්ථාවකදී

## 20. පුහුණුකරුගෙන් (Coach) උපදෙස් ලබාගැනීමට හා පිටියෙන් පිටතට යෑම (Advice / Leaving Court )*

20.1. තරඟ අතුරු වටයක් (rally) අවසන්වී නැවත නව අතුරුවටයක් (new rally) පටන් ගැනීමට පෙර ඒ අතර කාලසීමාවේදී පමණක් (Only when the shuttle is **not** in play) ක්‍රීඩකයාට අවශ්‍ය නම් පිටියෙන් (court) පිටත ආසන්නව සිටින පුහුණුකරුගෙන් (coach) උපදෙස් ලැබීමට අවසර ඇත

20.2. එහෙත් උපදෙස් ලබාගැනීම හෝ ලැබීම හේතුකොටගෙන තරඟවටය අනවශ්‍ය පරිදි ප්‍රමාද වීමක් (delay) හෝ බාධාවක් (disturb) නොවිය යුතුය. එසේ පමාවක් හෝ බාධාවක් වුවහොත් ඒ පිළිබඳව අවවාද කිරීමට ප්‍රධාන විනිසුරුවරයාට (umpire) බලයක් ඇත.

20.3. අනුමත විවේක කාල වලදී හැර විනිසුරුගේ අවසරයක් රහිතව පිටියෙන් පිටතට යාමට ක්‍රීඩකයන්ට අවසර නොමැත. (උදා:-වතුර බීම සහ දහඩිය පිසදැමීම සඳහා...)

## 21. රේඛා විනිසුරුවන්ගේ (Line Judges) පිරිනැමීමේ විනිසුරුගේ (Service Judge) තිරණ වෙනස් කිරීමේ බලය*

ඉහත විනිසුරුවන් ලබාදුන් තිරණ සාධාරණ නොවේ යැයි ප්‍රධාන විනිසුරුට (Umpire) සනාථ වන්නේ නම්, එම තිරණ වෙනස් කිරීමේ බලය ප්‍රධාන විනිසුරුට ඇත

## 22. විනිසුරුවරයාගේ වචන මාලාව (vocabulary)

22.1. **දළ විශ්ලේෂණය (overview)**
බැඩ්මින්ටන් තරඟයක් විනිශ්චය කිරීමේදී ප්‍රධාන විනිසුරු වරයාට (umpire) අමතරව පිරිනැමීම් විනිසුරු (service judge) සහ ඊට අමතරව රේඛා විනිසුරුවරුන් (line judges) 10 දෙනෙක් කටයුතු කරයි. 12 දෙනෙකුගෙන් සමන්විත එම කණ්ඩායම බැඩ්මින්ටන් පිටිය තුල ස්ථානගතවී ඇති අන්දම 30 පිටුව යටතේ නිරූපනය කර ඇත.

22.2. **වචනමාලාව (vocabulary) :-**

ප්‍රධාන විනිසුරු (umpire) විසින් තරඟයකදී භාවිතා කරන වචනමාලාවේ පොදු වදන් කිහිපයක් පහතින් ඉදිරිපත් කර ඇත.

**ක්‍රීඩකයන් හඳුන්වාදීම** :- ( පාසැල් 02 ක් අතර යුගල තරඟයකදී )

" Ladies and Gentlemen this is the semi- final match of men's doubles . On my right, Gothami Junior School Gampaha. represented by , Dinusha Senaviratne and Manuj Wijayaratne. On my left, Bandaranayaka College , Gampaha. represented by Pubudu Tennakoon and Samith Gunathilaka " .

යුගල තරඟයකදී පිරිනැමීම කරන්නා (server) සහ පිරිනැමීම ලබන්නා (receiver) හඳුන්වා දෙන්න.
" Pubudu to serve to Dinusha"

" Love all ; Play "
සමඟම තරඟය ආරම්භවේ. තරඟයේ ලකුණු ප්‍රකාශයට පත්කිරීමේදී සෑම විටම පිරිනැමීම සිදුකරන්නා (server) ගේ ලකුණු **පළමුව** ප්‍රකාශයට පත්කල යුතුය.
" Service Over "
තරඟයකදී පිරිනැමීම සිදුකල ක්‍රීඩකයා (server) එක් තරඟ අතුරු වාරයක්දී (rally) පරාජයට පත්වූ විට ; යුගල තරඟයකදීද වලංගු වෙයි.
(උදා :- " Service Over " ; Five (05) ; One (01)"

" 20 Match point 09 " / " 29 Match point 28 "
අවසාන වන ලකුණු වන, 21 ට **පෙර**, 20 වෙනි ලකුණ ලබාගත්විට
පලමු තරඟ වාරය ( 1 st game) ජයග්‍රහණය කල ක්‍රීඩකයාම දෙවන තරඟ වාරයේදී ( 2 nd game) ලකුණු 20 හෝ අවසන් ලකුණට පෙර ලකුණ ලබාගත්විට.

1 වන තරඟ වාරයේදී ( 1 st game) ජයග්‍රහණය කල ක්‍රීඩකයා වෙනුවට, අනික් ක්‍රීඩකයා 2 වන තරඟ වාරයේදී, ලකුණු 20 හෝ අවසන් ලකුණට පෙර ලකුණ ගෙන ඇති අවස්ථාවකදී ;" ....... Match point ......." වෙනුවට " ... Game point ....." යනුවෙන් ප්‍රකාශ කරනු ලැබේ.

" 29 Game point All " / " 29 Match point All "
ක්‍රීඩකයන් දෙපිලම අවසන් ලකුණට පෙර ලකුණ ලබාගත්විට (ඉහත සඳහන් අවස්ථාවන් අනුව).

" Interval"
තරඟ වාරයේදී එක් පිලක් **ලකුණු 11 ක්** ලබාගත් පසුව හිමිවන **තත්පර 60ක** විවේක කාලය ප්‍රකාශ කිරීම

" Court No. 1 ; 2 Minutes Interval "
තරඟ වාර (Game) දෙකක් අතර ලැබෙන තත්පර 120ක විවේක කාලය ප්‍රකාශ කිරීම

" Court No. 1 ; 20 Seconds "
තරඟ වාරයේදී එක් පිලක් **ලකුණු 11 ක්** ලබාගත් පසුව හිමිවන **තත්පර 60ක** විවේක කාලය තුලදී **තත්පර 40 ක් අවසන් වනවාත් සමඟම දෙවරක්** දැනුම්දෙන්න.
තරඟ වාර (Game) දෙකක් අතර ලැබෙන තත්පර 120 ක විවේක කාලය තුලදී **තත්පර 100 ක් අවසන් වනවාත් දෙවරක්** දැනුම්දෙන්න.

" 1 st Game won by Pubudu and Samith " ; " Twenty One (21) ; Ten (10) ”
1 වන තරඟ වාරය ( 1 st Game ) පුබුදු සහ සමිත් ක්‍රීඩකයන් නියෝජනය කල යුගලය (pair) ජයග්‍රහණය කලවිට

" One Game All "
දෙපිලම තරඟවාර (Games ) එක බැගින් ජයග්‍රහණය කලවිට

" Match won by Pubudu and Thisal " ; " 21 , 10 ; 21 , 8 "
1 වන සහ 2 වන තරඟවාර දෙකම පුබුදු සහ සමිත් ක්‍රීඩකයන් නියෝජනය කල යුගලය ජයග්‍රහණය කලවිට

" Second game ; Love all ; Play "
(දෙවන තරඟවාරය ආරම්භ කිරීම)

" Final Game ; Love All ; Play "
3 වන සහ අවසාන තරඟවාරය ( 3 rd and final game) පටන් ගැනීම සඳහා)

" Change ends " 3 වන තරඟ වාරයේදී එක් පිලක් **ලකුණු 11 ක්** (කේවල/යුගල /මිශ්‍ර යුගල) ලබාගත් පසුව පිටියේ පැති (sides) මාරු කරගත යුතුය.

**යුගල තරඟයකදී (Doubles) විනිසුරුවරුන් 12 දෙනා ස්ථානගතවී ඇති ආකාරය හා පිටියේ සැකැසිම.**




A = ප්‍රධාන විනිසුරු (Umpire)

B = පිරිනැම්මී විනිසුරු
(Service judge)

X = රේඛා විනිසුරුවන්
(Line judges)

(Source: - BWF)

## 23. රේඛා විනිසුරුවන් (line judges) ප්‍රධාන විනිසුරු (umpire) සමග සිදුකරණ කරන සංඥා (signals)








( Shuttle is **<u>OUT</u>** ) ( Shuttle is **<u>IN</u>** ) ( If **<u>UNSIGHTED</u>** )

“OUT” යනුවෙන් හඬනැගිය යුතුය

(Source :- BWF)

## <u>පිරිනැමීම් විනිසුරු (service judge) විසින් ක්‍රීඩකයන් වැරදි ආකාරයට පිරිනැමීමක් (service fault) සිදුකරණ විට නිකුත් කරන සංඥා (signals)</u>

සැ.යු. :- **<u>service fault</u>** එකක් පිළිබඳ තින්දුවක් ගැනීමට පෙර එම වැරැද්ද 100% වූ බවට Service Judge ට තහවුරු විය යුතුයි එසේ <u>නොමැති</u> විට **service fault** සංඥා නිකුත් <u>නොකිරීමට</u> වග බලා ගනියි.


(a)


(b)


(c)


(d)


(e)

(Source :- BWF)

(a) = 13.1 (i) ජේදයේ විස්තර කර ඇති වැරදි ආකාරයට පිරිනැමීම සිදුකරන විට (Service fault)

(b) = 13.1 (ii) ජේදයේ විස්තර කර ඇති වැරදි ආකාරයට පිරිනැමීම සිදුකරන විට (Service fault)

(c) = 13.1 (iii) ජේදයේ විස්තර කර ඇති වැරදි ආකාරයට පිරිනැමීම සිදුකරන විට **<u>හෝ</u>** පිරිනැමීම කොටුව (service court) හි සීමා ඉරි (boundary lines) පෑගීම. (Service fault)

(d) = ක්‍රීඩකයන් සූදානම් වූ පසුව, පිත්තේ පළමුව ඉදිරියට ගෙන යන ඉරියව්ව (first forward action) පිරිනැමීම ආරම්භ කල බව සැලකේ. එම ක්‍රියාවලියේ වරදක්වූ අවස්ථාවකදී නිකුත් කරන සංඥාව (Service fault)

(e)= පිරිනැමීම සිදුකරණ ආරම්භක මොහොතේදී පිහාටු පන්දුවේ <u>මූඩිය</u> (base of the Shuttle cock) බැඩ්මින්ටන් පිත්ත (badminton racket) මත ඍජුව සම්බන්ධ නොවීම. (Service fault)

## 24. යුගල තරඟයක තරඟ අතුරු වට (rallies) කිහිපයකදී පිරිනැමුම් පැත්ත මාරුවීම හා ලකුණු හිමිවන ආකාරය Changing Service Courts & Scoring in Doubles

(a) A සහ B පිලෙහි (Initial serving side) **A ක්‍රීඩකයා** තරඟ වටය ආරම්භයේදී C සහ D පිලෙහි (Initial receiving side) **C ක්‍රීඩකයාට** පිරිනැමීමක් (service) සිදුකරයි. ආරම්භක ලකුණු තත්ත්වය **0 – 0** (love all)




(b) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
ලකුණු තත්ත්වය **1 -0** (Service over : one - love)
C සහ D පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් වම් පිරිනැමීම් පැත්තේ (left service court) සිට **D ක්‍රීඩකයා** ( එනම් new server) **, B ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(c) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **2 – 0 (two- love)**
**මෙහිදී C හා D ක්‍රීඩකයන් දෙදනා තම පිරිනැමුම් පැත්ත ( left / right Service Court)** මාරු කරයි **D ක්‍රීඩකයා** (server) දකුණු පිරිනැමීම් පැත්තේ (right service court) සිට **A ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(d) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **1 – 2** (Service over : one - two)
A සහ B පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් වම් පිරිනැමීම් පැත්තේ (left service court) සිට **B ක්‍රීඩකයා** ( එනම් new server) **, C ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(e) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **3 – 1** (Service over : three - one)
C සහ D පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් **වම්** පිරිනැමීම් පැත්තේ (left service court) සිට **C ක්‍රීඩකයා** ( එනම් new server) **, B ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(f) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **2 – 3** (Service over : two - three)
A සහ B පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඉරට්ටේ** බැවින් **දකුණු** පිරිනැමීම් පැත්තේ (right service court) සිට **A ක්‍රීඩකයා** ( එනම් new server) **, D ක්‍රීඩකයාට** එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(g) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **3 – 3 ( three all)**
**මෙහිදී A හා B ක්‍රීඩකයන් දෙදනා තම පිරිනැමුම් පැත්ත ( left / right Service Court)** මාරු කරයි **A ක්‍රීඩකයා** (server) වම් පිරිනැමීම් පැත්තේ (left service court) සිට **C ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




වැඩි විස්තර සඳහා 15.2 හා 16.2 බලන්න